සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/06/M/02/09

ඔබේ අංකය / உமது இல / Your No: ..............................

දිනය / திகதி / Date: 2016.11.10

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂවරුන් හා

සියළුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් වෙත.

**සමෘද්ධි ජාතික වෙළඳ ප්‍රදර්ශනය**

**බත්තරමුල්ල දියත උද්‍යාන පරිශ්‍රය - 2016.12. 06, 07, 08**

වසර විස්සකට වැඩි කාලයක් තිස්සේ සහනාධාර ලබාදී, යටිතල පහසුකම් සපයා, බැංකු ක්‍රමයකට හුරු කරමින්, ක්ෂුද්‍ර මූල්‍ය ණය සපයමින් දිවයින පුරා ලක්ෂ පහකට වැඩි ව්‍යාවසායකින් පිරිසක් සමෘද්ධි වැඩසටහන මගින් බිහිකර ඇත. කෙසේ වෙතත් ඔවුන්ගෙන් වැඩි පිරිසක් සුළු පරිමාණ ව්‍යාපාරිකයින් වීම විශේෂත්වයකි. වෙළඳපලේ ඇති දැඩි තරඟකාරිත්වය නිසාම ස්ථාවර වෙළඳපල කොටසක් හිමිකර ගැනීම හා වෙළඳපල කොටස පුළුල් කර ගැනීම ඔවුන්ගේ ප්‍රධාන ගැටළුවක් ලෙස දැකිය හැක. සමෘද්ධි වැසටහන ගැන විශ්වාසය තබා ඇති ඔවුන් තව දුරටත් ශක්තිමත් කල යුත්තේ මේ නිසාවෙනි. මේ සඳහා දිස්ත්‍රික් මට්ටමින් කැපීපෙනෙන හා සාර්ථක සමෘද්ධි ව්‍යාපාරිකයින් ඒකරාශි කර ජාතික මට්ටමින් වෙළඳ ප්‍රදර්ශනයක් පැවැත්වීම තුලින් ඔවුන්ව අභිප්‍රේරණය කල හැක. එසේම තව දුරටත් සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධවී සිටින අනෙක් ව්‍යාපාරිකයින්ටද මෙය උත්තේජයක් සපයනු ඇත.

එම අරමුණ පෙරදැරිව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි ජාතික වෙළඳ ප්‍රදර්ශනය 2016දී පැවැත්වීමට තීරණය කර ඇත. ඒ අනුව 2016 දෙසැම්බර් මස 06,07,08 යන තෙදින තුළ බත්තරමුල්ල දියත උද්‍යාන පරිශ්‍රයේදී මෙම ජාතික වෙළඳ ප්‍රදර්ශනය පැවැත්වීමට කටයුතු යොදා ඇත. ප්‍රදර්ශනය සඳහා සහභාගිවන ව්‍යවසායකයින් අතුරින් හොඳම ව්‍යවසායකයින් 10 දෙනෙකු තෝරාගෙන ඇගයීමට ලක් කර ත්‍යාග මුදල් සහ සහතික පත්‍ර පිරිනැමීමට සැලසුම් කර ඇත.

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ )පාලන( / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

1. එක් දිස්ත්‍රික්කයකට අදාල නිෂ්පාදන ප්‍රදර්ශනය සඳහා 20'x10' කුටි 3ක් වෙන් කර දෙනු ලැබේ ( අවශ්‍යතාවය අනුව 10'x10' කුටි 6 ක් ලෙසද භාවිතා කල හැකිය). ඒ අනුව වඩාත් සුදුසු ව්‍යවසායකයින් කීපදෙනෙකු තෝරා ගැනීම කළ යුතුය. තෝරාගනු ලබන ව්‍යවසායකයින් දින 03 තුලම රැදී සිටිය යුතුය. කුටියක ඡායා රූපයක් මේ සමග අමුණා ඇත.

2. සමෘද්ධි ආදර්ශ ගම්මාන ආශිතව සිදු කරනු ලබන විශේෂිත නිෂ්පාදන සඳහා අවස්ථාව ලබා දෙමින් එම නිෂ්පාදන පවතින ආදර්ශ ගම්මානයකට 20'x10' එක් වෙළඳ කුටියත් අමතර වශයෙන් වෙන් කෙරේ.

3. ව්‍යවසායකයින් ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රවාහනය කර ගැනීමට සුදුසු වැඩපිලිවෙලක් යොදා ගත යුතුය. මේ සඳහා ඔවුන් දිරිමත් කිරීමක් ලෙස දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ඒ ඒ දිස්ත්‍රික්ක අනුව ලබාදෙනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය ඇමුණුම් අංක 01හි සඳහන් වේ. ඒ අනුව අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලීම් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වේ. 2016.12.06 වන දින පෙ.ව. 10.00 වන විට සියළු ප්‍රදර්ශන කුටි අලංකාරව සරසා භාණ්ඩ ප්‍රදර්ශනයට අවශ්‍ය පියවර ගෙන තිබිය යුතුය. දින 3 සඳහාම භාණ්ඩ ප්‍රදර්ශන කාලය පෙ.ව. 10.00 සිට ප.ව. 11.00 දක්වා වේ.

4. ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය ආහාරපාන තමා විසින් සපයා ගතයුතු අතර අවශ්‍ය නේවාසික පහසුකම් දෙපාර්තමේන්තුව මගින් සපයනු ලැබේ.

5. සහභාගිවනු ලබන ව්‍යවසායකයින් විසින් දින 3ටම ප්‍රමාණවත් පරිදි තම නිෂ්පාදන රැගෙන ආ යුතුය. එසේම අලෙවිකුටිය තුළ නිෂ්පාදන රැඳවීම සඳහා ආධාරක කිසිවක් නොමැති අතර තම නිෂ්පාදන ඇසුරුම් කිරීමට හා ප්‍රදර්ශනයට අවශ්‍ය උපකරණද රැගෙන ආ යුතුය. (අසුන් ගැනීම සඳහා අවශ්‍ය බංකුවක් කුටිය තුළ ඉදිකර ඇත.)

6. ප්‍රදර්ශන භූමිය තුළ ආහාර සැකසීම හා පරිභෝජනය සඳහා ඇසුරුම් නොකරන ලද ආහාර අලෙවියට අවකාශය නොමැති බව දියත භාරකාර ආයතනය අවධාරනය කර ඇත.

7. දිස්ත්‍රික් මට්ටමින් සමෘද්ධි ජාතික වෙළඳ ප්‍රදර්ශනය සඳහා සහභාගී කරවනු ලබන ව්‍යවසායකයින් පිලිබඳ තොරතුරු මේ සමඟ අමුණා ඇති ආකෘතිය මගින් 2016.11.18 වන දිනට පෙර අධ්‍යක්ෂ (අලෙවි) වෙත ලැබීමට සැලැස්විය යුතුය.

8. නිෂ්පාදන වෙළඳනාම පුවරු රූදවීම සඳහා එම ස්ථානයේ ආධාරක නොමැත. මේ සමඟ අමුණා ඇති ආකෘතිය අනුව ඩිජිටල් මාධ්‍යයෙන් නාම පුවරුවක් සකස් කර ගත යුතු අතර වෙනත් කිසිඳු ආකාරයක නාම පුවරුවක් රැගෙන නොයෙන ලෙසත් උපදෙස් ලබාදෙන්නේ නම් මැනවි.(ඇමුණුම අංක 2 හා 3)

9. ප්‍රදර්ශනයේ ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීමට දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිලධාරියකු නම් කර දුරකථන අංකයද සමඟ මා වෙත දන්වන්න.

අලෙවි අංශයේ දුරකථන අංකය 0112-862659



නීල් හපුහින්න

අධ්‍යක්ෂ ජනරාල්